# ශ්‍රී ලංකාවේ චෝළ පාලන සමය පිළිබඳ ඓතිහාසික විග්‍රහයක්

එම්.කේ.එල්. අයිරාංගනී

## 1. හැඳින්වීම

පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය සැළකිල්ලට ගැනීමේදී දැකිය හැකි ප්‍රධාන සංසිද්ධියක් වන්නේ, භූගෝලීය පිහිටීම තුළින් ඉන්දීය උපමහද්වීපයට ආසන්නයෙන් පිහිටීම නිසා ආරම්භක සමයේ සිටම එරට දේශපාලන උච්චාවචනයන්ට අනුකූලව නිරන්තරයෙන් ආක්‍රමණයන්ට මුහුණදීමට ශ්‍රී ලංකාවාසීන්ට සිදුවීමයි. දේශපාලනමය හෝ ආර්ථිකමය අරමුණු මුල්කර ගනිමින් දිවයිනට එල්ල වූ මෙවැනි ආක්‍රමණ රැසක් පිළිබඳ තොරතුරු වංසකථා සාහිත්‍යය තුළින් අනාවරණය වුවත්, ඒවා දෙස බෞද්ධාගමික දෘෂ්ටිකෝණයකින් බැලීම නිසා ඓතිහාසිකව වැදගත් තොරතුරු රැසක් ගිලිහී ගොස් තිබීම, ඇතැම් ආක්‍රමණයන් පිළිබඳ කරුණු මුළුමනින්ම නොසළකා හැරිය අවස්ථා හමුවීම, ආක්‍රමණ නාමමාත්‍රිකව දැක්වීම විනා එහි ස්වභාවය හෝ ප්‍රතිඵල නොදැක්වීම වැනි දුර්වලතා රැසක් පවතී. උක්ත මූලාශ්‍ර මත පදනම් වී මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ සිදුකිරීම නිසා එකී ආක්‍රමණිකයින් පිළිබඳ පුළුල් අර්ථ කථනයක් ලබාදීමට නොහැකි වී ඇත. එබැවින් මෙම පර්යේෂණය තුළදී පුරාතන ලංකාවට එල්ල වූ විදේශ ආක්‍රමණ අතුරින් සුවිශේෂී වැදගත්කමක් දරනු ලබන චෝළ ආක්‍රමණ හා ඔවුන් යටතේ උතුරු ලංකාවේ පාලන කටයුතු පිළිබඳ ඉතිහාසය සම්බන්ධයෙන් මෙතෙක් කරුණු දක්වා ඇති ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රවල දෘෂ්ටි කෝණයන් පිළිබඳවද නැවත කියවා බැලීමක් සිදු කෙරෙන අතර මෙතෙක් අනාවරණය වී ඇති පුරාවිද්‍යාත්මක සාක්ෂි කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් උක්ත විෂය පථය කෙරෙහි නව අර්ථකථනයක් ලබා දීමට මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ.

## 2. චෝළ පාලකයින් යටතේ විදේශ බල ව්‍යාප්තිය සහ ඒ තුළ පැවති වාණිජ පරමාර්ථ-

තුංගභද්‍රා නදියෙන් දකුණෙහි පිහිටි මුළු ප්‍රදේශයම එක්සත් කරමින් දකුණු ඉන්දියාවේ සුවිශාල භූමි ප්‍රදේශයක දේශපාලන බලය නතුකර ගත් සොළී අධිරාජ්‍යය දේශපාලන මෙන්ම ආර්ථික අරමුණු මුල්කොටගෙන දහවැනි සියවස පමණ වනවිට ඉන්දියන් සාගර කලාපීය රටවල් කෙරෙහිද අවධානය යොමු කළේය- ඔවුන්ගේ දේශපාලන ආධිපත්‍ය පළමුවැනි පරන්තක, පළමුවැනි රාජරාජ, පළමුවැනි රාජේන්ද්‍ර චෝළ වැනි ප්‍රබල රජුන් යටතේ එහි උපරිම ස්ථානය කරා ගෙන ගියේය. දහවැනි සියවසේදී චෝළ වංසය අධිරාජ්‍යයක් කරා නැගී ඒමේ මුල්ම ප්‍රකාශනය ශ්‍රී ලංකාවට එල්ල වන්නේ එම පෙළපතේ ප්‍රමුඛ පාලකයකු ලෙසින් සැලකෙන පළමුවැනි පරන්තක රජු (ක්‍රි.ව.907955) සමයේදීය. ඔහු විසින් දිවයින අල්ලා ගනිමින් 'මදුරයියුම්

ඊලාමුම් කොණ්ඩ' යන උපාධි නාමයද ආරූඪ කර ගෙන තිබේ.[1] (මජුම්දාර්, 2000; පි.274) ඔහුගේ මෙම ශ්‍රී ලාංකේය ආක්‍රමණය තුළ හුදු දේශපාලන අරමුණක් පමණක් පැවති බව පෙනේ. එනම් දෙවැනි රාජසිංහ සමයේදී ශ්‍රී ලංකාවේ තබා ගිය පාණ්ඩ්‍ය රාජාභරණ ලබා ගැනීම හා පාණ්ඩ්‍ය රාජ වංසයට සහයෝගය ලබා දුන් ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට හානි පැමිණවීම යනාදී කරුණුයි. මෙම ආක්‍රමණයෙන් සැළකිය යුතු බලපෑමක් මෙරටට සිදු නොවූ අතර චෝළයින්ටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි විය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් චෝළ අවධානය දැඩිව යොමු වූයේ පළමුවැනි රාජරාජ, පළමුවැනි රාජේන්ද්‍ර චෝළ වැනි ප්‍රබල රජුන්ගේ පාලන අවධිවලය. මෙහිදී ප්‍රථමයෙන් ආසන්නයෙහිම පිහිටි ශ්‍රී ලංකාවටත්, දෙවනුව තත් කාලීන සාගර වෙළෙඳ ජාලයෙහි ප්‍රබලතම අතරමැදි වෙළෙඳ ප්‍රජාව වූ ශ්‍රී විජයටත් ඒ ආසන්නයෙහි වූ දූපත් රැසකටත් චෝළ ආක්‍රමණ එල්ල වූ බව ප්‍රාථමික මූලාශ්‍ර ආශ්‍රයෙන් අනාවරණය කරගත හැකිය-

පළමුවැනි රාජරාජ චෝළ රජුගේ විසිනවවැනි රාජ්‍ය වර්ෂයට අයත් තංජෝර් සෙල්ලිපියෙහි දැක්වෙන ඓතිහාසික හැඳින්වීමේ ඔහුගේ දෙස් විදෙස් යුධ ජයග්‍රහණ පිළිබඳ තොරතුරු අන්තර්ගතය- චේර, පාණ්ඩ්‍ය දේශයන් මෙන්ම කාණ්ඩලූර් (Kāndalūr) හා විලිනාම් (Viliñam) යන ප්‍රදේශද අල්ලාගත් බව එහි දැක්වේ-[2] (Neelakanta Sasthi, 1955; p.172.) බටහිර හා දකුණු මුහුදු සීමා ආක්‍රමණය කළ පළමුවැනි රාජරාජ අනතුරුව තදාසන්නව පිහිටි ඉලාමණ්ඩලම් (Ilamandalam) හෙවත් ශ්‍රී ලංකාව ආක්‍රමණය කළේය- තිරුවලංගාඩු සෙල්ලිපිය අනුව රාජරාජ බලවත් හමුදාවක් සමඟ පැමිණ මෙහි ප්‍රදේශ ගණනාවක් අල්ලා ගත් බව සනාථ වේ-[3] (Ibid.) පළමුවැනි රාජරාජ රජුගේ මෙම ආක්‍රමණය පිළිබඳ <u>මහාවංසයෙහි</u> කිසිදු සඳහනක් නැත. ක්‍රි-ව- 993දී පමණ රජරට ආක්‍රමණය කළ රාජරාජ එතැන් සිට සැහෙන බලපෑමක් එම ප්‍රදේශ තුළ සිදු කළ බව සෙල්ලිපි සාධක කිහිපයකින් සනාථ වේ-[4] (සිරිවීර, 2005; පි.76.) ඔහුගේ තංජෝර් සෙල්ලිපියෙහි දැක්වෙන යුධමය ජයග්‍රහණ අතර ඉමාමණ්ඩලම් යන්න සඳහන් වීමත් එය සිංහල දේශය බවට පිළිගැනීමත්[5] (බස්නායක, 2004; පි.193) මෙහිලා සඳහන් කළ හැකිය- ක්‍රි-ව-1017 දී පළමුවැනි රාජේන්ද්‍ර චෝළ විසින් දිවයින ආක්‍රමණය කොට මුණ්මුඩි චෝළ මණ්ඩලම් යනුවෙන් නම් කරමින්[6] (Epigraphia Zelanica, Vol.vi, p. 91- Veluppilalai, 1971; pp.16-18- Veluppilalai, 1972; pp.42- 55.) රජරට ප්‍රදේශය චෝළ අධිරාජ්‍යයේ කොටසක් ලෙසින් පාලනය කළේය- ක්‍රි-ව-1024 දී නිකුත් කළ තිරුමලෙයි සෙල්ලිපියට අනුව රාජේන්ද්‍ර රජු යුවරාජ වශයෙන් සිටි කාලයේ එනම්, ක්‍රි-ව-1018දී ඊළමණ්ඩල හෙවත් ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම අල්ලා ගෙන එහි ධනය පැහැර ගත් බව හෙළි කරයි-[7] (බස්නායක,2004; පි-193) එමෙන්ම මෙකී ආක්‍රමණය සනාථ වන පුරාවිද්‍යාත්මක සාක්ෂියක් මෙරට හැම්මෙන්හිල් බලකොටුවේ දෙමළ සෙල්ලිපියෙහිද අන්තර්ගත වේ. එම ලිපියේ ජයන්කොන්ත මුවෙන්තාවෙළාර් යුධ හමුදාපති විසින් මුළු සිංහල රාජ්‍යය පමණක් නොව ශ්‍රී ලංකාවේ රජු, ඔහුගේ දේවිය හා සියලු වස්තුව අල්ලා ගත් බව සඳහන් වේ.[8] (Indrapala,1971; pp.10-12.) මෙහි එන සිංහල රජු වනාහි වංසකථාවේ සඳහන් මහින්ද[9] (<u>මහාවංසය</u>, 2004. පිටු.249 250)හෙවත් පස්වැනි මිහිඳු රජු බව අනාවරණය කර ගත හැකි වේ. සමස්ත වශයෙන් දිවයිනම ආක්‍රමණය කළ බව සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි ප්‍රමාණවත් නොවූවත් ශ්‍රී ලංකාවේ උතුරු කොටස පමණක්වත් යටත් කළ බව මෙකී පුරාවිද්‍යාත්මක හා වංසකථා තොරතුරුවලින් පැහැදිලි වෙයි-

තංජෝර් සෙල්ලිපියෙහි දැක්වෙන පළමුවැනි රාජරාජගේ යුධ ජයග්‍රහණ සළකා බැලීමේදී ශ්‍රී ලංකාව හැර තවත් දූපත් රැසකට ඔහු විසින් ආක්‍රමණ එල්ල කළ බව සනාථ වේ- එහි දැක්වෙන පරිදි ඔහු ඈදාගත් ප්‍රදේශ අතර පැරණි දූපත් දොළොස් දහසක් වූ බව දැක්වේ- මෙම පැරණි දූපත් යනු මාලදිවයින් බව මහාචාර්ය එච්-ටී- බස්නායක දක්වයි-[10] (බස්නායක, 2004; පි.197) මෙසේ පළමුවැනි රාජරාජ විසින් ආරම්භ කරන ලද විදේශ බල ව්‍යාප්තිය රාජේන්ද්‍ර චෝළ විසින් ඉදිරියටම ගෙන යනු ලැබිණ- ඔහුගේ හයවැනි රාජ්‍ය වර්ෂයේදී නිකුත් කරනු ලැබූ තිරුවලංගාඩු තඹ තහඩු ලේඛනවලට අනුව ක්‍රි-ව-1025 දී මලය අර්ධද්වීපයට අයත් කටාහ හෙවත් කදාරම් රාජ්‍ය අල්ලා ගෙන ඇත-[11] ( එම, 2004; පි.196)

මෙම ආක්‍රමණය දෙමළ පද්‍යයකින් සනාථ වන ආකාරය රොලින්සන් පෙන්වා දී ඇත-[12] (රොලින්සන්, 1959; පි-182) මෙකී ප්‍රයාණය සිදු වූ අවස්ථාවේම සෙසු අග්නිදිග ආසියානු ප්‍රදේශත් ආක්‍රමණය කළේද යන්නට ප්‍රමාණවත් සාක්ෂි හමු නොවේ. දෙමළ සෙල්ලිපියකට අනුව පළමුවැනි රාජේන්ද්‍ර චෝළ රජු කදාරම් රාජ්‍යයේ පාලකයා වූ සංග්‍රාම විජයෝත්තුංග වර්මන් පරදවා ශ්‍රී විජය, පන්නෙයි, පැරණි මලෙයියරූර්, මාර්රූඩිම්ගන්, ඉලංගාශෝක, මෙවිලිම්බන්ගම්, තලයිත් තත්කෝලම්, මාපප්පාලම්, මාදමාලිංගම්, වලෙයිප්පණ්ඩූර්, ඉලාමුරිදේශම් හා මානක්කවාරම් යන ප්‍රදේශ ජය ගත් බව සඳහන් වන අතර මේ සියලු ප්‍රදේශ සුමාත්‍රාවේ හා මලය අර්ධද්වීපයේ පැවති ඒවා බවට හඳුනාගෙන ඇත-[13] (බස්නායක, 2004; පි.198)

එහෙත් ඒවායින් ස්ථිර ලෙස හඳුනාගෙන ඇත්තේ නැගෙනහිර සුමාත්‍රා වෙරළේ පිහිටි පාලෙන්බාන්, මලයූර්(ජම්බී), හා පානේ යන ස්ථානත්, සුමාත්‍රාවේ උතුරු තුඩුවේ වූ ලංකාසුබ(ලීගෝර්) හා ආචේ නම් ස්ථානයත්, ටකාලා, කේඩා, සිංගප්පූර් නමින් නූතනයේ හඳුන්වන පැරණි තුමාසික් යන ස්ථානයත්, නිකොබාර් දිවයිනුත් පමණි- [14] (ඩබ්-ජී-ඊ.හෝල්, 1976; පි-68-)



(චෝළ බල ව්‍යාප්තිය දැක්වෙන සිතියම)

එමෙන්ම ඔහු විසින් සාන්දිමන්ති යනුවෙන් හැඳින්වූ අරාබි මුහුදේ දූපතක්ද අල්වා ගත් බව කියැවේ-[15] (බස්නායක, 2004; පි.197)

ආසියාව වෙත වාණිජ ආධිපත්‍යයක් එල්ලවීම පිළිබඳ ඉතිහාසය ක්‍රි-ව- දහසයවැනි සියවසට ගැනෙන පෘතුගීසි ආගමනයත් සමගින් විග්‍රහ කිරීමට ඇතැම් විචාරකයින් පෙළඹුණද, මෙකී සිදුවීම ඊට සියවස් හයක් පමණ මෙපිට වූ චෝළ බල ව්‍යාප්තිය තුළින්ම විද්‍යමාන වන බව පෙන්වා දිය හැකිය- දකුණු ආසියානු කලාපයේ දහවැනි සියවස තෙක් සිදු වූ විදේශ

ආක්‍රමණ පිළිබඳ ඉතිහාසය බෙහෙවින් රාෂ්ට්‍ර පාලන බලය ව්‍යාප්ත කිරීමෙහිලා හේතු සාධක වුවත්, ඉන් ඇරඹෙන ඉදිරි සියවස්වල විදේශ බල ව්‍යාප්තිය හුදෙක් කාලීන සාගරය හරහා සිදු වූ වාණිජ තරඟකාරීත්වයත් සමඟ අපෝහක සම්බන්ධතාවයකින් බැඳී පවතින බව හඳුනා ගත හැකි වේ- අභ්‍යන්තර හා බාහිර දෙඅංශයෙන්ම සළකා බලන විට චෝළ බල ව්‍යාප්තිය ප්‍රධාන වාණිජ අරමුණු කිහිපයක් වටා සංකේන්ද්‍රගතව පැවති බව පැහැදිලි කර ගත හැකිය- ඉන් එක් මුඛ්‍ය අභිමථාර්ථයක් වූයේ මේ වන විට ප්‍රබල වාණිජ බලයක් අත්පත් කරගෙන සිටි මුස්ලිම්වරු පලවා හැරීමයි- අග්නිදිග ආසියාවත් සමඟ පැවති සාර්ථක වෙළඳාමෙහි අරාබි තරඟය ගැන හොඳින් දැන සිටි චෝළයින් මලබාරය(කේරළ ප්‍රදේශය) අල්ලා ගැනීමෙන් මෙම තරඟයෙහි මුලටම පහර දුන් බව රොමිලා තාපර් පෙන්වා දී ඇත්තේ මෙනිසාය.[16](රොමිලා තාපර්, 1964; පි.194)

එමෙන්ම අරාබි වෙළෙඳාමේ වැදගත් සන්ධිස්ථානයක් වූ මාලදිවයින්ද ග්‍රහණයට ලක් කිරීමට පළමුවැනි රාජරාජ තැත් කිරීම මෙහිලා තවත් නිදසුනකි- මේවන විට අරාබීන්ගේ සාර්ථක වාණිජ මධ්‍යස්ථානයක් වූ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයද යටත් කිරීමට සොළීන් උනන්දු වූ අතර කදාරම් රාජ්‍ය ජය ගැනීම පසුපසද අරාබීන් සතු වාණිජ අවස්ථා අහිමි කිරීමේ වෑයම පැවතුණු බව පෙන්වා දිය හැකිය- මන්ද යත් මේ වන විට අරාබීන්ගේ ඉන්දීය සාගර වෙළඳාමේ අවසාන ගමනාන්තය කේඩා දක්වා වැටුණු අතර එහිදී චීන භාණ්ඩ මිලට ගනු ලැබීය-[17] (යූසුප්, 1972- පි-666-) මලයාසියාව හා චීනයත් සමඟ වූ වෙළෙඳාම සියතට ගැනීමට උත්සුක වූ චෝළ පිරිස් කදාරම් රාජ්‍යයටද පහර දුන්හ- මේ අනුව අරාබීන් වාණිජ සබඳතා පැවැත්වූ සෑම රාජ්‍යයකටම චෝළ ආක්‍රමණ එල්ල වූ බව පෙනී යයි-

චෝළයින්ගේ අග්නිදිග ආසියාතික යුධමය ව්‍යාපාරය ශ්‍රී ලාංකේය යුධ ක්‍රියාදාමයට සාපේක්ෂව බෙහෙවින් වෙනස් මඟක් ගත්තේය- ශ්‍රී ලාංකාව ආක්‍රමණය තුළදී මෙන් ආධිපත්‍යයට නතු කරගත් ප්‍රදේශ දීර්ඝ කාලීනව පවත්වාගෙන යාමක් මෙහිදී සිදු නොවීය- ශෛලේන්ද්‍ර රාජ්‍යයට විරුද්ධව කළ යුද්ධය ඇතැම් විට චෝළ රජවරුන් සිය නාවුක හමුදාවේ බලය පෙන්වා කීර්තියක් ලබා ගැනීමට සිදු කළ එකකැයි ඇතැම් විද්වතුන් මත පල කළ ද[18](බස්නායක, 2004; පි.197) එම ආක්‍රමණ එල්ල වූ කාලවකවානුව සහ ශෛලේන්ද්‍ර රාජ්‍යයේ වාණිජ ක්‍රියාදාමය සංසන්දනාත්මකව බැලීමෙන් එහි පැහැදිලි වාණිජ උවමනාවක් ගැබ්ව ඇති බව විසද වේ- සමකාලීන අවධිය වනවිට මලය අර්ධද්වීපය සුමාත්‍රා, ජාවා හා අවට දිවයින්ද අයත්ව තිබූ ශ්‍රී විජය අධිරාජ්‍යය ඉන්දියාව හා චීනය අතර වැටුණු මුහුදු මාර්ග පාලනය කළ මුහුදුබඩ රාජධානියක් ලෙස ඉදිරියට විත් තිබුණි- දහවැනි සියවස වන විටත් චීනය හා දකුණු ඉන්දියාව අතර ඉතා දියුණු වෙළෙඳාමක් පැවතුණි-[19] (රොමිලා තාපර්, 1964; පි.194) එමෙන්ම අධිරාජ්‍ය චෝළයෝ තානාපති හා වෙළෙඳ උවමනාවන් සඳහා ක්‍රි-ව-1016, ක්‍රි-ව-1033, හා ක්‍රි-ව-1077 යන වසරවල චීනයට දූතයින් යැවූ අතර ශ්‍රී විජයද 1017දීත් චීනයට දූතයින් පිටත් කොට ඇති බව හෙළි වේ-[20] (නීලකණ්ඨ ශාස්ත්‍රී, 1962; පි.189) මුහුදු මාර්ග වැටී තිබූ මෙම රාජ්‍යයන් දෙකෙන්ම තත් අවධියේ චීන කාසි ද බහුලව හමුවී තිබීමෙන් මෙය වඩාත් තහවුරු වේ. [21]( Bopearachchi, p.31)

## 2.1.2. ශ්‍රී ලංකාව යටත් කර ගැනීමෙහිලා බලපෑ චෝළ උපායමාර්ගික අවශ්‍යතාවය-

චෝළ විදේශ බල ව්‍යාප්තිය තුළදී ඒ ඒ රජ්‍යයන් කෙරෙහි යොමු වූ විශේෂිත අරමුණු පැවති බව උක්ත සඳහන් තොරතුරු මගින් හෙළිවන අතර ශ්‍රී ලංකාව යටත් කර ගැනීම කෙරෙහි බලපෑ සාධක ඒ අතුරින් සුවිශේෂී වන බව පෙනේ. දිවයිනට ආක්‍රමණ එල්ල කළ පළමු චෝළ පාලකයා පළමුවැනි රාජරාජ නොවේ. සිවුවැනි මිහිඳු රජුන් දවස ඌරාතොටට ගොඩබට චෝළ ආක්‍රමණයක් සිංහලයින් විසින් පැරදවූ බව පූජාවලියේ සඳහන් වේ.[22](සූරවීර, 1998; පි.506) මහාවංසයේ මේ බව ඍජුව නොදැක්වූවත් මිහිඳු රජු සොළී බලසෙන් විසින් ගිනිලන ලද සිත්කලු ගෘහයක් කළ බව දැක්වීම තුළිනුත් මෙහිලා සාක්ෂි සැපයේ.[23](මහාවංසය,2004;පි.246) එබැවින් චෝළයින් දිවයිනේ උතුරුකරයට අවධානය යොමු කිරීමත් දේශීය පාලකයින් පොළොන්නරුව ඇතුලු නැගෙනහිර කලාපය සංවර්ධනය කිරීමත් එකම කාල වකවානුවක සිදු වී ඇති බව පැහැදිලි වේ.

එහෙත් චෝළයින් විසින් දහවැනි සියවසෙහි ආක්‍රමණය කරන ලද වෙනත් විදේශ රාජ්‍යයන්ට සාපේක්ෂව බලන විට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය බෙහෙවින් වෙනස් මගක් ගනී. මහාවංසය පෙන්වා දෙන පරිදි මෙම ආක්‍රමණ සිදු වූයේ වෙළෙන්දකු මගින් ශ්‍රී ලංකාවේ දුබල පාලනයේ තොරතුරු චෝළ රජු විසින් අනාවරණය කරගත් පසුය.[24] (මහාවංසය,2004; පි.249) මේ වන විට අගම්පඩි හමුදාව පාලනය කරගත නොහැකි වූ පස්වැනි මිහිඳු රජු ආරක්ෂාව පතා රුහුණට පලාගොස් සිටි බවද කියවේ.[25](එම) මහාවංසකරු දක්වන මේ ප්‍රවෘත්ති තුළින්ම දේශපාලන මෙන්ම වාණිජ තොරතුරු දෙරට අතර හුවමාරු වූ බව පෙනී යයි. අගම්පඩි හමුදාවේ කැරැල්ලට හේතු වී ඇත්තේද ආර්ථික කරුණකි. ඒ අතරම ශ්‍රී ලංකාවේ සිට වාණිජ ප්‍රජාව දකුණු ඉන්දියාවේ වරායන්ට හා රාජ සභාවට පැමිණ ඇති බවද තහවුරු වේ. මෙම ආක්‍රමණයේ ප්‍රතිඵල දක්වෙන මහාවංස තොරතුරු අනුව පෙර රජදවස ලක්දිව තබා ගිය පාණ්ඩ්‍ය රාජාභරණ හා කිරීටය ලබා ගැනීම ආක්‍රමණයේ අරමුණක් බව හෙළිදරව් කරයි.[26](එම)

වංසකථා පුවත අනුව පාලකයාගේ දුර්වලතා චෝළයිනට දිවයින අල්ලා ගැනීමට පාදක වූ එක් කරුණක් හෙළිදරව් කළද ප්‍රබල නාවික හමුදාවක් ගොඩනගාගෙන සිටි චෝළයින්ට වාණිජ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා අංශ කිහිපයකින් වැදගත් විය. සුවිශේෂිත ඉලක්කයක්ව පැවතුණ ශ්‍රී ලංකාව තුළ කවර දේශපාලන තත්ත්වයක් පැවතියත් එය ආක්‍රමණය කිරීම ඔවුන්ගේ අනිවාර්ය අංගයක් බවට පත්ව තිබුණ බව පෙන්වා දිය හැකි වේ. ශ්‍රී ලංකාව ස්වාධීනව පැවතීම දේශපාලන වශයෙන්ද චෝළයින්ට ඍජුවම අහිතකර තත්ත්වයක් ඇතිවීමට බලපෑ හැකි කරුණකි. චෝළ බලයට එරෙහිව සිංහල, පාණ්ඩ්‍ය හා කේරළ ඒකාබද්ධ බලයක් ලෙස වරින් වර පෙළගැසුණු බැවින් පාණ්ඩ්‍ය හා කේරළ බලයන් මැඩ පැවැත් වූ පළමු රාජරාජ[27](නීලකණ්ඨ ශාස්ත්‍රී, 1962; පි.169) හා පළමු රාජේන්ද්‍ර චෝළ අධිරාජයෝ සිංහල දේශයද සියතට ගැනීම අනිවාර්යය ඉලක්කයක් කර ගත්හ.

චෝළ බලයට එරෙහිව සිංහල හා ඉන්දීය පාලක පෙළපත් එකමුතු වූ බව ක්‍රි.ව. 956972 කාලයේ රජකළ සිවුවැනි මහින්ද රජුගේ ක්‍රියා තුළින්ද පැහැදිලි වේ. සොළීන්ගෙන් විය හැකි උවදුරු වටහාගත් සිවුවැනි මිහිඳු රජු නැගෙනහිර ඉන්දියාවේ පිහිටි කාලිංග දේශයේ රාජ

කුමාරිකාවක් විවාහ කරගනිමින් මිත්‍ර සබඳතා ගොඩනගා ගත්තේය.[28](මහාවංසය, 2004; පි.245) මෙම කරුණ ද චෝලයින්ට විරුද්ධව සෙසු රාජ්‍ය මිත්‍ර සන්ධාන ගොඩනගා ගත් ආකාරයත් දේශීය රජවරුන් බෙංගාල බොක්ක වෙළෙඳ කලාපය පිළිබඳ දැනුවත් වී සිටි බවත් මෙම කරුණින් හෙළිවේ. මෙම මිත්‍ර ජාලයේ වැදගත්ම ස්ථානීය පිහිටීමක් ලබා තිබූ ශ්‍රී ලංකාව අල්ලා ගැනීම අත්‍යවශ්‍ය සිද්ධියක් බවට එතුළින් පත්වී තිබුණි. වාණිජ ආධිපත්‍ය ලබාගනිමින් බෙංගාල බොක්ක චෝළ තාටකයක් කිරිමේ අපේක්ෂාවෙන් සිටි චෝළ රජුන්ට ශ්‍රී ලංකාව අල්ලාගෙන සිටිම ඉන්දියාවේ චෝළ අධිරාජයාගේ ආරක්ෂාවට රුකුලක් වූ අතරම, චෝළ සමුද්‍ර බලය දියුණු කිරිමේ වැඩ පිළිවෙලේ වැදගත් අංගයක්ද වූයේය.[29](නීලකණ්ඨ ශාස්ත්‍රී, 1964; පි.336)

එමෙන්ම පළමුවැනි රාජරාජ රජුගේ කාලයේදී වඩාත් පුළුල් වූ චෝළ මුහුදු ප්‍රතිපත්තියේ පරමාර්ථය වූයේ බෙංගාලබොක්ක, මලයාසියාව හා චීනය සමඟ වූ සශ්‍රීක වෙළදාම චෝළයින්ගේ පාලනයට යටත් කොට ගැනීමය.[30](එම) එකී අභිමතාර්ථ සාධනය කරගැනීම සඳහා ශ්‍රී ලංකාව අතිශයින් අවශ්‍ය හා වැදගත් යටත් විජිතයක් කළ යුතුවිණි. ක්‍රි.ව 1025 ශ්‍රී විජය අධිරාජ්‍යයට විරුද්ධව යුධ ව්‍යාපාරයක් ගෙන ගියත් එහි ඉන්දීය විජිතයක් පිහිටුවීම හෝ බලය අල්ලාගෙන සිටීමක් සිදු නොකළ අතර ශ්‍රී ලංකාව චෝළ මණ්ඩලයක් ලෙස පාලනය කිරීමටත්, දේශීය අභියෝග රැසක් හමුවේ තම බලය පවත්වාගෙන යාමටත් චෝළයින් උත්සාහ කළ බව වංසකථා තොරතුරු තුළින් හඳුනාගත හැකි වීමෙන් මේ බව වඩාත් පැහැදිලි වෙයි.

සමකාලීන අවධිය වන විට ඉන්දීය සාගර වෙළදාමේ මධ්‍යස්ථානය බවට බෙංගාල බොක්ක පත් වී තිබූ අතර චෝළයින්ගේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථාන බවට පූහාර් වෙළඳ නගරය පත්වී තිබුණි.[31](රොලින්සන්,1959; පි.181) කාවේරි නදී මුවදොර මෙම මහා වෙළඳ නගරය පැවති අතර එය විදේශ වෙළඳුන් රැසකගේ හුවමාරු මධ්‍යස්ථානයව පැවතුණි.[32](එම) භූගෝලීය පිහිටීම අනුව ශ්‍රී ලංකාව ඊට තදීයව පිහිටි රාජ්‍ය වූ බැවින් එම සංවර්ධනීය වෙළෙඳ මධ්‍යස්ථානය සමඟ සමීප සබඳතා නිසැක වශයෙන් පවතින්නට ඇත. එසේ පූහාර් ප්‍රබල වාණිජ මධ්‍යස්ථානය ලෙස නැගී එන විට ඊට ආසන්නයෙන් පැවති ශ්‍රී ලංකාව යටත්කර ගැනීම පාණ්ඩ්‍යයන් යටත්කර ගැනිම සෙයින්ම වැදගත් කමක් හිමිකර ගත්තේය.

ශ්‍රී ලංකාව යටත් කර ගැනිමේ තවත් ප්‍රධාන උපාය මාර්ගික අවශ්‍යතාවයක් වූයේ විශාල වාණිජ වැදගත්කමකින් යුතු උතුරු හා නැගෙනහිර කලාපයේ පිහිටි වරායයන් අල්ලා ගැනිමයි. දසවැනි සියවසේ පෙරදිග දේශ සංචාරයක යෙදුණු අබුසයිද්ගේ වාර්තා හා තිරුකේතීශ්වරම් ප්‍රදේශයෙන් ලැබී ඇති පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුව දසවැනි සියවසේ ශ්‍රී ලංකාව විදේශ රටවල් ගණනාවක් වෙළෙඳ සම්බන්ධතා පැවැත්වූ මධ්‍යස්ථානයක් ව පැවති බව සනාථ වේ.[33](ගුණවර්ධන, 1961; පි.280) කවේරි පටුනෙහි පිහිටි වෙළඳ මධ්‍යස්ථානය ප්‍රධාන කරගත් බෙංගාල බොක්ක වාණිජ කලාපය තුළ සිදු වූ වෙළෙඳාම පූර්ණ වශයෙන් මෙහෙයවීමට නම් ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ සබඳතා නතර කළ යුතුවිය. උතුරෙහි පිහිටි ඌරාතුරෙයි වරායත්, නැගෙනහිර වූ ගෝකණ්ණතිත්ත වරායත් මෙම වෙළෙඳ සම්බන්ධතාවලදී අතිශයින් වැදගත් විය. මේ වන විට පොළොන්නරුව ආශ්‍රිත ප්‍රදේශය තුළ සිදුවූ ජනාවාස ව්‍යාප්තියත් සංවර්ධන කාර්යයනුත් සැලකිල්ලට ගැනීමේදී[34] (මහාවංසය, 2004; පිටු.205,215,220221,227,247) ගෝකණ්ණ වරාය වාණිජ වැදගත්කමකට පත්ව තිබූ ආකාරය වටහා ගත හැකිය. පළමුවැනි රාජේන්ද්‍ර චෝළට පෙර පළමුවැනි රාජරාජ දිවයිනේ උතුරු ප්‍රදේශ යටත් කර ගැනීමේ අවශ්‍යතාවයද එහි වූ

වරායන් බවට අනුමාන කළ හැකිය. එමෙන්ම කයිට්ස් දූපතට ආසන්නයෙන් වූ හැම්මෙන්හිල් බලකොටුවෙහි දෙමළ ශිලා ලිපිය මඟින්ද පැහැදිලි වන්නේ වෙළෙඳ මාර්ගයේ වූ එවැනි කුඩා දූපත් පවා රාජේන්ද්‍ර චෝළ සිය ග්‍රහණයට ගෙන තිබූ බවයි.[35](Indrapala,1971;pp.10-12)මෙම වරායන් සිය ආධිපත්‍යයට නතු කර ගැනීමෙන් බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු වෙළෙඳ ආධිපත්‍ය චෝළයින් සතු කරගැනීම අරමුණ වුවත් දකුණු ප්‍රදේශය යටත් කොට ගත නොහැකි වූයෙන් එම අරමුණු පූර්ණ වශයෙන් ඉටු නොවුණි. මන්ද යත් දකුණේ සිට චෝළ විරෝධී ආක්‍රමණ මෙහෙය වූ විජයබාහු ගිණිකොණදිග වරායන් හරහා බුරුමය සමග වෙළෙඳ සබඳතා පැවැත්වූ බව මහාවංසය සාක්ෂි තුළින් හෙළිවීමයි.[36] (මහාවංසය, 2004; පි.256) සමස්ත දිවයින අල්ලා ගැනීමට නොහැකිවීම මත ඉන්දීය සාගර වාණිජ ඒකාධිකාරය අහිමි වුවත් ගෝකණ්ණ වරාය හා උතුරේ වරායන් අල්ලා ගැනීම චෝළයන් ලැබූ ඉමහත් ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැකිය. චෝළයින් විසින් සිය සාගර වෙළෙඳ සුරක්ෂිතතාවය තහවුරු කරගැනීමේ උපාය මාර්ගයක් ලෙස ශ්‍රී ලංකාව ආක්‍රමණ කිරීමේ මෙම ක්‍රියාදාමය ඒ. ඩබ්. ස්පෙන්සර් විසින් " දේශපාලන මංකොල්ලයක්" (Politics of Plunder) ලෙස අර්ථකථනය කර ඇත. [37] (Kiribamune,1989;p.69) එබැවින් චෝළ වාණිජ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී උපාය මාර්ගිකව වැදගත් ප්‍රමුඛතම රාජ්‍ය ලෙස ශ්‍රී ලංකාව පැවති බව මෙමඟින් තහවුරු වේ.

## *2.2. උතුරු ශ්‍රී ලංකාව චෝළ ප්‍රාන්තයක් බවට පත් වීම හා ඔවුන්ගේ පරිපාලන රටාව*

වසර එක්දහස් පන්සියයක් පමණ කාලයක් පුරා සිංහල දේශයේ අගනගරයව පැවති අනුරාධපුර රාජධානිය දහවැනි සියවසේ අවසාන දශකය වන විට බිඳ වැටෙන්නට විය. වංසකථාකරු පෙන්වා දෙන පරිදි සිවුවැනි මහින්ද රජුගෙන් පසු බලයට පැමිණි පස්වැනි සේන, පස්වැනි මිහිඳු වැනි රජවරුන් දුර්වල පාලකයින් වූ බැවින් සිය නිලධාරීන් හා ජනතාව මෙන්ම රටේ ආර්ථිකයද හසුරුවාගත නොහැකි තත්ත්වයක් උදාවී තිබුණි. උද්ගත වූ අභ්‍යන්තර දේශපාලන තත්ත්වය හමුවේ පස්වැනි මිහිඳු රජු රුහුණට පලාගිය බවත්, එහෙයින් කේරළයන්, සිංහලුන් හා කර්ණාටකයින් තම තමන්ට නිසි පරිදි රජරට පාලනය කළ බවත් මහාවංසකරු දක්වා තිබේ.[38](මහාවංසය, 2004; පි.249) ශ්‍රී ලංකාව ආක්‍රමණය තම දැඩි අවශ්‍යතාවයක් වී පැවති චෝළයින්ට මේ තත්ත්වය තම අපේක්ෂාව සමීප කර ගැනීමට සුළු අනුබලයක් සැපයූහ. ඒ අනුව දෙවැනි වරට චෝළ ආක්‍රමණය මෙහෙය වූ රාජේන්ද්‍ර චෝළ විසින් ක්‍රි.ව. 1017 විශාල වස්තු සම්භාරයක් සමඟින් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සිය අණසකට යටත් කර ගන්නා ලදී.[39](එම) මෙම ජයග්‍රහණ පිළිබඳ විස්තරාත්මක තොරතුරු රාජේන්ද්‍ර රජුගේ තංජෝර් (කරන්ඩයි) තහඩු ලිපිවලින් ද සනාථ වන බව කියැවේ.[40] (නීලකණ්ඨ ශාස්ත්‍රී, 1964; පි.338) ඉන් අනතුරුව චෝළ බලයේ මූලස්ථානය බවට පොළොන්නරුව තෝරාගනු ලැබූ අතර එය ජනනාථ මංගලම් යනුවෙන් හැඳින්වූ බව, රාජේන්ද්‍ර චෝළ රජුගේ (ක්‍රි.ව.10521064) නම සඳහන් වන අංක දෙක ශිව දේවාලයෙන් හමු වූ ශිලාලිපියෙන් පැහැදිලි වේ.[41](සේනානායක, 1998 ; පි.9 - Wijesekera, 1990; p.159 )

පාලන කේන්ද්‍රස්ථානය අනුරාධපුරයෙන් පොළොන්නරුවට මාරුවීම කෙරෙහි බලපාන සාධක කිහිපයක් කෙරෙහි ඉතිහාසඥයින්ගේ අවධානය යොමුව ඇතත් ඒවා බොහෝදුරට අභ්‍යන්තරයට කේන්ද්‍රිය වූ ඓතිහාසික දෘෂ්ටියකින් යුතු නිගමන බව පෙනී යයි. රෝහණයෙන් එල්ල වූ තර්ජනවලට මුහුණදීමේදී අනුරාධපුරයට වඩා පොළොන්නරුවේ භූගෝලීය පිහිටීම යෝග්‍යවීම මෙම අගනුවර මාරුවීමට හේතුව බව ඇතැම් ශාස්ත්‍රඥයින්ගේ මතය වී තිබේ.[42](සිරිවීර,2001; පි.78) එහෙත් රජරට විදේශීය පාලකයකු යටතේ පැවති සෑම වකවානුවකම ඊට විරුද්ධව රෝහණයෙන් ප්‍රතිචාර එල්ලවීම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ මුල් අවධියේ සිටම අඛණ්ඩව දැකිය හැකි වූ පොදු කරුණකි. ඒ තත්ත්වයම චෝළ පාලන සමයේ දී සිදුවීම ඉතිහාසයේ සුවිශේෂී සිදුවීමක් නොවේ. අනෙක් අතට නාවික මෙන්ම යුධ ශක්තියෙන්ද තත් කාලවකවානුව වන විට චෝළයින් අතිමහත් බලයකින් යුක්ත වූ හෙයින් දකුණෙන් එල්ල වූ බලපෑම් දැඩි තර්ජනයක් සේ සැළකීම ප්‍රායෝගික නොවේ. රාජේන්ද්‍ර යටතේ සිදුවූ ආක්‍රමණයේදී රෝහණය දක්වා පැමිණ සියලු වස්තුව හා රාජාභරණ මෙන්ම පාණ්ඩ්‍ය කිරීටයද ලබාගත් බව ඉහතින් පෙන්වා දෙන ලද අතර එහෙයින් ම රෝහණයට ද දැඩි බලපෑමක් කොට සිය අවශ්‍යතාවය සපුරාගත් බව පැහැදිලි වේ. එබැවින් පොළොන්නරුව දක්වා රාජධානිය මාරුකිරීම තුළ උක්ත සාධක යම් දුරකට හේතුවන්නට ඇතත් සමකාලීන චෝළ ශක්තියට සාපේක්ෂව බැලීමේදී එහිලා බලපෑ මුඛ්‍ය සාධකය ලෙස ගිණිය හැකි නොවේ.

පොළොන්නරුව මධ්‍යගත පිහිටීමක පැවතීම සැළකිල්ලට ගැනීමේදී, මධ්‍යගත අගනගරයක අවශ්‍යතාවය පැණ නගින්නේ දිවයින තුළ රැඳී සිටිමින් පාලනය කිරීමට සූදානම් අවස්ථාවකදීය. එළාර වැනි සොළී පාලකයින් අගනගරයේ සිට රට පාලනය කළත් රාජේන්ද්‍ර සොළී අධිරාජ්‍යයා මෙරට පාලනය කළේ දකුණු ඉන්දියාවේ සිටයි. ආර්ථික අරමුණු උදෙසා ක්‍රමානුකූල පරිපාලන ක්‍රමවේදයක් ගෙන ගිය බව පිළිගත හැකි නමුත් රටේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි යහපත් පාලනයක් ගෙන යාමේ අවශ්‍යතාවයක් ඔවුන්ට තිබුනේද යන්න සැක සහිතය. එමෙන්ම එවැනි මධ්‍යගත නගරයකට පැමිණි පසු රෝහණයේ කැරළිකාරී කටයුතු නැවතුණු බවට සාක්ෂි හමු නොවීම මෙම මතය දුර්වල කිරීමට තවදුරටත් හේතු වෙයි. අගනගරය අනුරාධපුරයේ පිහිටි සමයේ පවා ශක්තිමත් දේශීය රජුන් යටතේ රජරට හා රෝහණය එක්සත්ව පැවති බවටත් ඉන් මුළු රටම ඒකඡත්‍ර කර පාලනය කළ බවටත් සාධක වංසකථා හා පුරාවිද්‍යාත්මක සාක්ෂි තුළින් හෙළිවීම කරණ කොට ගෙන මධ්‍යගත පිහිටීමකින් යුත් නගරයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය මත පොළොන්නරුව තෝරාගැනීම එතරම් ප්‍රායෝගික නොවන බව සනාථ වෙයි.

<u>මහාවංසය</u> කරුණු විචාරීමේදී පෙනීයන පරිදි රාජේන්ද්‍රගේ ආක්‍රමණ අවස්ථාවේදී ගොඩබට තැන් පටන් ධන සම්පත් කොල්ල කා අනුරාධපුරය විනාශ කරනු ලැබීය.[43](<u>මහාවංසය</u>, 2004; පි.249) එම අවස්ථාවේදීත්, පසුව චෝළ විරෝධී සටන්වලදීත් අගනගරයට දැඩි ලෙස හානි පැමිණෙන්නට ඇති බවට සැකයක් නැත. එහෙත් එය රාජධානිය මාරුකිරීමට තරම් ප්‍රබල සාධකයක්ද යන්න ගැටලුවකි. අගනගරය සමෘද්ධියෙන් උපරිමස්ථානයේ පැවැති හත, අට හා නවවැනි සියවස්වල පටන්ම පොළොන්නරුව උප අගනගරයක් ලෙස සංවර්ධනය වෙමින් පැවැති බව පෙනේ. එමෙන්ම දහවැනි සියවසේ ආරම්භයේ රාජධානිය තුළ සිදු වූ අභ්‍යන්තර ආරවුල් හමුවේ එහි පරිහානිය ඇරඹී තිබුණු බව පෙන්වා දිය හැකිය. එබැවින් චෝළයින්ගේ ආක්‍රමණ මෙම පරිහානියට පත් වෙමින් තිබූ අගනගරයේ ශ්‍රී විභූතිය නිමාකිරීමට බලපාන ලද

එක් හේතුවක් පමණි. එහි වැඩි භාරය අභ්‍යන්තරික වශයෙන් මේ වන විටත් සිදුවී අවසන් වෙමින් පැවතිණි.

එමෙන්ම මහාචාර්ය ඒ.එල්. බෂාම් පෙන්වා දෙන පරිදි අගනුවර වශයෙන් පොළොන්නරුව යොදා ගැනීමට හේතුව දහවැනි, එකොළොස්වැනි සියවස්වල ඇති වූ ද්‍රවිඩ ආක්‍රමණයයි.[44](බැෂම්, 1962; පි.11) එම ආක්‍රමණ හරහා සැළකිය යුතු ද්‍රවිඩ පිරිසක් මෙරටට සංක්‍රමණය වූ බවත් අගම්පඩි හමුදාව ප්‍රමාණයෙන් හා බලයෙන් විශාල වූ බවත් සංක්‍රමණ අවස්ථාවන්හිදී ඔවුන්ගේ සහාය ඉන්දීය ආක්‍රමණිකයන්ට ලැබුණු බවත් ඒ හරහා අනුරාධපුරය කොල්ල කන ලද බවත් ඔහු වැඩි දුරටත් පෙන්වා දෙයි.[45](එම) එමෙන්ම මෙසේ වර්ධනය වූ දෙමළ අගම්පඩි සේනාව පස්වැනි මහින්ද සමයේ දී රට කොල්ල කන ලද බවත් රජමාළිගය වටලා රජු පළවා හරින තැනට වැඩ කළ හෙයින් රට අරාජික වීම හේතුවෙන් පළමුවැනි රාජේන්ද්‍ර ආක්‍රමණ මෙහෙය වූ බව පෙන්වා දී ඇත.[46](එම)

අගම්පඩි සේනාවන්ගේ කැරළි හා සමාජ විරෝධී ස්වභාවය රාජ්‍ය බලය දුර්වල කිරීමට ඉමහත් සේ හේතු වුවත් එය නව රාජධානියක් කරා විතැන් වීමට ප්‍රබල හේතුවක් වී යැයි සිතිය හැකි නොවේ. එහෙත් පළමුවැනි රාජරාජගේ ආක්‍රමණය සිදු වූ වර්ෂය පිළිබඳ නිශ්චිතතාවයක් නැති නිසා එම ආක්‍රමණය හා පස්වැනි මිහිඳු රජු රුහුණට පලායාම එකම අවස්ථාවක සිදුවීද නැතිනම් රජු පලාගිය පසු ආක්‍රමණය සිදුවීදයි නිශ්චය කළ නොහැක.[47](ගුණවර්ධන, 1961; පි.281) අනෙක් අතට පස්වැනි මිහිඳු රජු වංසකථා අනුව යමින් දුර්වල පාලකයකු, අදක්‍ෂයකු ලෙස නොවැදගත් චරිතයක් බවට පත් වී සිටියේ නම් බලසම්පන්න රණශූර පළමුවැනි රාජරාජට අගනගරය, රෝහණය හෝ පාණ්ඩ්‍ය කිරීටය ඇතුළත් මෞලි භාණ්ඩයන් ලබා ගැනීමට නොහැකි වූයේ මන්ද යන කරුණද ඉස්මතු කළ හැකිය. එබැවින් පාලනයේ අදක්‍ෂභාවය හා එනයින් දිවයින චෝළයින් සතු වීය යන වංසකථා විස්තර තත් වූ පරිද්දෙන් පිළිගැනීම ප්‍රඥාගෝචර නොවේ.

එසේම පොළොන්නරුව ඒ වන විටත් සංවර්ධනීය තත්ත්වයක පැවතීමද ඒ කෙරෙහි යොමුවීමට හේතුවක් බව මහාචාර්ය බෂාම් පෙන්වා දී ඇත.[48](එම) දහවැනි සියවස තුළ නැගෙනහිර සංවර්ධනය කිරීමේ ක්‍රියාදාමය දේශීය පාලකයින්ගේ අනාගත අගනගර සැලැස්ම විදහා දැක්වීමක් ලෙස අර්ථකථනය කළ හැකි නමුත් එකී සංවර්ධනය ඉලක්ක කොට සොළී පාලකයින් පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය බවට පත්කර ගත්තේ යැයි දැක්වීම තාර්කික නොවේ. චෝළයින් පොළොන්නරුව රාජධානිය බවට පත් කර ගන්නා විට එහි පැවති සංවර්ධනය ඔවුනට කිසියම් වාසියක් ගෙන දෙන්නට ඇතත්, එතෙක් අනුරාධපුරයෙහි වූ ශ්‍රී විභූතිය හා කෘෂික දියුණුවද නැවත යථා තත්ත්වයට පත් නොකිරීමට හා රාජධානිය පොළොන්නරුවට රැගෙන යාමට තීරක සාධකය එය නොවේ. ආක්‍රමණ අවස්ථාවන්හි අනුරාධපුරය විනාශවීම අවස්ථා රැසකදී සිදු වූ බවත් ඒවා ඒ ඒ රජුන් යටතේ නැවත යථා තත්ත්වයට පත් වූ බවත් වංසකථා තුළින්ම හෙළිදරව් වේ. එහෙත් මීට පෙර ලක්දිව පාලනය කළ විදේශිය පාලකයින් හා චෝළයින්ගේ අරමුණු පැහැදිළිවම වෙනස් ස්වභාවයක් දැකිය හැකිය.

චෝළයින්ට ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීමට බලපෑ උපායමාර්ගික හේතුන් හා අගනගරය මාරුවීම අපෝහක සබඳතාවයකින් යුක්ත වේ. පොළොන්නරුව සංවර්ධනය කර උප

අගනුවරයක් ලෙස අටවැනි, නවවැනි සියවස්වල සිට පවත්වාගෙන ඒම, එම කලාපයෙහි දේශපාලන මෙන්ම ආර්ථික වටිනාකම මෙරට පාලකයින්ට කල්තියා වැටහීමේ ප්‍රතිඵලයක් ලෙස අර්ථ දැක්විය හැකිය. චෝලයින්ට සිය ඉන්දීය සාගර වාණිජ අභිමථාර්ථයන් සාධනය කර ගැනීමේදී ශ්‍රී ලාංකේය විදේශ සම්බන්ධතා දේශපාලන හා ආර්ථික වශයෙන් දැඩි තර්ජනයක් වූ අතර මෙහි ස්වාභාවික පිහිටීමෙන්ම කාලීන වැදගත්කමක් ලබා සිටි ත්‍රිකුණාමල වරාය ඔවුන්ට අතිශයින් වැදගත් විය. මහාතිත්ථ වරාය හා අනුරාධපුරය සම්බන්ධ වී තිබුයේ යම් සේද; මහවැලි නදිය හරහා පොළොන්නරුව හා ත්‍රිකුණාමලය බද්ධ වූයේද එපරිද්දෙන්මය. එනිසා අභ්‍යන්තරයට නැඹුරු වූ දේශපාලන සාධකත් බාහිරට යොමු වූ ආර්ථික සාධකයත් එක්තැන් වූ සංධිස්ථානයක් වීම පොළොන්නරුව නව අගනගරය වීමෙහිලා හේතුභූත වූ බව පෙන්වාදිය හැකිය.

## *2.3 ශ්‍රී ලංකාව තුළ චෝළ පරිපාලනයේ විශේෂතා*

සාගර වාණිජ ආධිපත්‍යය උදෙසා ආක්‍රමණකාරී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ පළමුවැනි රාජරාජ, පළමුවැනි රාජේන්ද්‍ර චෝළ නරපතීන් සිය යටත් ප්‍රදේශ මණ්ඩල නවයක් යටතට පත්කොට පරිපාලනය කළහ. ඉන් පාරසමුද්‍රිතව තිබූ එකම විජිතය හෙවත් මණ්ඩලය වූයේ ශ්‍රී ලංකාවයි. එය මුන්මුඩිචෝළ මණ්ඩලම් නමින් හැඳින්වීය.[49]( Veluppillei,1971;p.18 - Ibid,1972; pp.42-55) එනමින් නම් කිරීම තුළින්ම ඔවුන් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සිය අභ්‍යන්තර මණ්ඩල මෙන්ම ඉතා වැදගත් පාලන ඒකකයක් ලෙස පවත්වාගෙන ගිය බව සනාථ වෙයි. ඉන්දියාව තුළ ප්‍රදේශ ඇඳා ගැනීමේදී චෝළ ප්‍රතිරාජයන්ගේ ක්‍රියාකලාපය තියුණු යුධමය වාතාවරණයක් ගත්තද ඉන් අනතුරුව ඔවුන් විධිමත් පරිපාලන තන්ත්‍රයක් ගෙන ගිය බව පැහැදිලි වේ.[50](රොමිලා තාපර්, 1964; පිටු.198205) චෝළ අධිරාජ්‍යයන්ගේ සෘජු මඟපෙන්වීම යටතේ මැනවින් ඒකාබද්ධ වූ නිලධාරී පිරිසක් විසින් පරිපාලන කටයුතු ගෙනයන ලදී.[51](එම, 1964; පි.198) චෝළ අධිරාජ්‍යයන් යටතේ දේශපාලනයත් ආර්ථිකයත් දැඩි ලෙස අන්‍යෝන්‍යව බැඳී පැවතුණි. ආර්ථිකය මත දේශපාලනය තීරණය වන තරමට ම ඔවුහු අර්ථක්‍රමයට ප්‍රමුඛතාවය ලබා දුන්හ. ඒ අනුව චෝළයින් සිය අභ්‍යන්තර මණ්ඩල අටට සාපේක්ෂව තදීයව පිහිටි විජිතය වූ ශ්‍රී ලංකාවේ යටත් ප්‍රදේශ පරිපාලනය කළ ආකාරයත් එහි ආර්ථික කටයුතු කෙරෙහි දැක්වූ සැලකිල්ලක් විමර්ශනයට ලක් කිරීම වැදගත් වේ.

ක්‍රි. ව.1017 දී දිවයින චෝළ ප්‍රාන්තයක් වීමේ සිට ක්‍රි.ව.1070 දී පළමුවැනි විජයබාහු විසින් චෝළ ග්‍රහණයෙන් රට මුදාගන්නා තෙක් අඩසියවසකටත් වැඩි කාලයක් මෙරට චෝළ පරිපාලනය යටතේ පැවතුණි. ඉන්දියාව තුළ ඔවුන්ගේ පරිපාලන රටාව අධ්‍යයනය කිරීමට මූලාශ්‍ර බහුල වූවත් ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ පාලන ක්‍රමවේදය ගැන සාක්ෂි දුලබ වේ. චෝළ අධිරාජ්‍යයේ පාලනය එකම මූලස්ථානයකින් කෙරුණු අතර එය වඩාත් විධිමත්ව පැවතුණු බවත් රාජවංශයට අයත් කුමාරවරු බොහෝ විට රාජධානියේ වැදගත් ප්‍රදේශ පාලනය සඳහා ප්‍රතිරාජයන් වශයෙන් පත් කරන ලද බවත් කියැවේ.[52](නීලකණ්ඨ ශාස්ත්‍රී, 1962; පි.208) දකුණු ඉන්දියාව තුළ චෝළ පරිපාලනය සැළකීමේදී ඔවුන් සතු අභ්‍යන්තර භූමි ප්‍රමාණය විශාලත්වය මත මණ්ඩල, වළනාඩු, නාඩු ආදී ලෙස බෙදා ඉතා සංවිධිත පාලන ව්‍යුහයක් ක්‍රියාත්මක කර තිබේ.[53] (එම)

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකීමේදී දිවයිනම සමස්තයක් ලෙස හැඳින්වීමේදී සොළීහු 'මහාමණ්ඩල' යන නම භාවිත කළ බව විශ්වාස කෙරේ.[54](කුලතුංග,1996; පි.12) පළාත් පරිපාලන කටයුතුවලදී දමිළ රාජ්‍යයේ පාරිභාෂිත ශබ්ද මාලාවම හඳුන්වා දුන් ඔවුන් අවම වශයෙන් මෙරට පාලන ප්‍රදේශ වළනාඩු හයකටවත් බෙදාතිබූ බව දැනට ලැබී ඇති සෙල්ලිපි සාක්ෂිවලින් හඳුනාගත හැකිය.[55](Pathmanathan. S. ,1978;pp.36-38) ඒවා පහත පරිදි පෙන්වාදිය හැකිය.

1. අරුන්මෝලිත්තේම වළනාඩු (Arunmolitteva Valanatu) මාතෝට්ටම්වලින් (මහාතිත්ථ)ලැබුණු සෙල්ලිපියකට අනුව එම නගරය අයත් වූයේ අරුන්මෝලිත්තේම වළනාඩු ලෙස හැඳින්වූ විශාල බල ප්‍රදේශයකටයි.[56] (Ibid- Veluppillei, 1972;pp.42-46)
2. නිකරිලික්ශෝල වළනාඩු (Nikariliccola Valanatu) පොළොන්නරුව හා ඒ අවට ප්‍රදේශ මෙම පරිපාලන ඒකකයට අයත් විය.
3 4. වික්‍රමචෝළ වළනාඩු (Kanakkan Kottiyaram) සහ රාජරාජ වළනාඩු (Moppicumpu Kottiyaram) මෙම වළනාඩු දෙක දිවයිනේ නැගෙනහිර කොටසේ විය.[57] (Pathmanathan. S.,1978;pp.36-38)
5. වීරපරකේශරී වළනාඩු (Viraparakecari Valanatu) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අයත් පෙරියකුලම්හී වෙල්කමම් නමැති ප්‍රදේශය මීට අයත් කොටසකි. එය අභයාශ්‍රය වළනාඩු (Abhayasraya Valanttu) හා රාජේන්‍ද්‍රසිංක වළනාඩු (Rajendra Cinka Valanatu) ලෙසද හැඳින්විණි.

මහාචාර්ය පද්මනාදන් පෙන්වා දෙන උක්ත වළනාඩුවලට අමතරව දිවයිනේ උතුරු ප්‍රදේශයේ තවත් වළනාඩු තිබූ බව සෙල්ලිපි සාධක විමසීමේදී හඳුනාගත හැකිය. උදාහරණ ලෙස කන්තලේ දෙමළ සෙල්ලිපියෙහි එන විස්තරවලට අනුව එම ප්‍රදේශය රාජේන්‍ද්‍ර චෝළ වළනාඩුව හෙවත් විච්චාතිර වළනාඩුවට අයත් බව පෙනීයයි.[58] (Gunasigam,1974;p.7) මේ කරුණු අනුව බලන විට සිංහල පාලන ක්‍රමය තුළ පැවති සම්ප්‍රදායික පළාත් ක්‍රමය වෙනුවට චෝළ පාලකයින් ආර්ථිකමය ලෙස වැදගත් වූ වාණිජ නගර කේන්ද්‍ර කරගනිමින් සිය මවුරටේ පරිදිම වළනාඩු නමැති ඒකක මෙහිද පිහිට වූ බව පැහැදිලි වේ. දේශපාලනමය පාර්ශ්වයට වඩා ආර්ථිකමය කරුණු මත මේවා පිහිටවූ බව පෙනේ.

මේ අනුව දැනට ලැබී ඇති සාක්ෂි පදනම් කරගෙන මෙරට චෝළ ග්‍රහණයේ ප්‍රදේශ අවම වශයෙන් වළනාඩු හයකට වැඩි ගණනකට බෙදා තිබූ බව පැහැදිලිය. ඒවා චෝළ අධිරාජ්‍යයන්ගේ, රැජිණියන්ගේ හා කුමාරවරුන්ගේ පදවිනාම හා ගුණවාචක නාමයන්ගෙන් හඳුන්වා තිබුණි. මෙම වළනාඩු බොහෝ විට දකුණු ඉන්දියාව තුළ වූ වළනාඩු තරම්ම උවමනාවෙන් පරිපාලනය කළ බව නිසැකය. එපමණක් නොව මෙවැනි වළනාඩු මෙරට තුළදී ද නාඩු වශයෙන්ද බෙදා තිබූ බවට සාක්ෂි කීපයක්ද හඳුනාගත හැකිය. නිදසුන් වශයෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් හමු වී ඇති පළමුවැනි රාජේන්‍ද්‍ර චෝළ රජුගේ ශිලාලිපියකට අනුව රාජරාජ පෙරුම්පල්ලි හෙවත් වෙල්ගම් වෙහෙර යනුවෙන් සිංහලෙන් හඳුන්වන විහාරස්ථානයට ද්‍රවිඩයින් විසින් කළ පරිත්‍යාග ගැන විස්තර දක්වීමේදී එම විහාරයේ පිහිටීම දක්වා ඇත්තේ " Stavayia Ramyana Manavatina Nattu" ලෙසිණි.[59](Dias,1990;p.159) එනිසා එය Prakecari

Valanatu[60] (Ibid) වට අයත් රම්‍යනා මනාවතිණ නමැති නාඩු නම් ඒකකයේ පැවති බව හෙළිවේ. තවද පොළොන්නරුවේ නාථනාර් කෝවිලෙන් (වෙල්ගම් වෙහෙර) ලැබුණු දෙමළ ලිපියක රාජේන්‍ද්‍ර චෝළ රජුගේ විසිපස්වැනි අවුරුද්දේ කරන ලද ලිපියෙහි, නන්දසේන මුදියන්සේ විසින් කළ පරිවර්තනයට අනුව වෙල්ගම් විහාරය හෙවත් රාජරාජ පෙරුම්පල්ලිය පිහිටා ඇත්තේ අභයශ්‍රීයතන් නාඩුවෙහිය.[61](මුදියන්සේ,1997;146) එහෙත් මහාචාර්ය පද්මනාදන් අභයාශ්‍රය දක්වා ඇත්තේ වීරකේශරී වළනාඩුවටම යෙදුණු තවත් නමක් ලෙසිණි.[62] (Pathmanathan.S.,1978;p.36) ඔහු වැඩිදුරටත් පෙන්වාදෙන පරිදි පොළොන්නරුවේ ශිව දේවාල අංක දෙකෙහි ඇති අධිරාජේන්‍ද්‍රගේ සෙල් ලිපියක Nattar පිළිබඳ ඇති සඳහනින් නාඩු නම් ඒකකයක රැස්වීමක් ගැන හෝ නාඩු නමැති ඒකකයක පදිංචිකරුවන් ගැන කියැවෙන බවත්, ඊලාම්හි පිහිටි Kottur Natu පිළිබඳව දකුණු ඉන්දීය සෙල්ලිපියකින් අනාවරණය වන බව දැක්වීමත් උක්ත අදහස තව දුරටත් සනාථ වන සාක්ෂීන් වේ.

එමෙන්ම මෙරට සිටි නිලධාරීන් පිළිබඳව විමසීම සඳහා පුළුල් සාක්ෂි නොමැති වුවත් ලැබෙන සීමිත සෙල්ලිපි සාක්ෂි, ඉන්දියාව තුළ චෝළ පරිපාලනයට අදාළ කරුණු සමඟ ගැළපීමෙන් යම් අදහසක් ගොඩනගා ගත හැකිය. නීලකණ්ඨ ශාස්ත්‍රී පෙන්වා දෙන පරිදි දකුණු ඉන්දීය චෝළ පාලන තන්ත්‍රය විවිධ තරාතිරම්වලට අයත් නිලධාරීන්ගෙන් සමන්විත වූ දීර්ඝ පිළිවෙත්වලින් යුක්ත, සංකීර්ණ නිලධාරී පාලන ක්‍රමයක් වූ අතර සමාජයේ විශේෂ පන්තියක් වශයෙන් තහවුරු වූ මේ නිලධාරීන් "පෙරුන්දනම්" නම් උසස් පන්තියකින් සහ "ශිරුදනම්" නම් පහත් පන්තියකින්ද සංවිධානය වී සිටියහ.[63](නීලකණ්ඨ ශාස්ත්‍රී, 1962; පි.208) එමෙන්ම ප්‍රාදේශීය සභා පාලනය සඳහා ඉතා දියුණු කාරක සභා ක්‍රමයක් විකාශය වී ඇත.[64] (එම) රාජ්‍ය පරිපාලනයේදී රජුට සහාය වීමට මන්ත්‍රී මණ්ඩලයක්, ඌර්, සභා යනුවෙන් සාමාන්‍ය මණ්ඩල දෙකක් වූ අතර ඉන් ඌර් මණ්ඩලය ගම්වලින් අයබදු එකතු කිරීම සිදුකොට ඇත.[65](බස්නායක, 2004; පි.208) මහාචාර්ය පද්මනාදන් පෙන්වා දී ඇත්තේ චෝළයින් යටතේ දියුණු වූ මේ ප්‍රාදේශීය ඒකකවලින් බ්‍රාහ්මණ ගම්මානවල සමාජ Sabhai ලෙසද බ්‍රාහ්මණ නොවන ගම්මානවල සමාජ Ūr ලෙසද හැඳින් වූ බවයි.[66] (Pathmanathan.S.,1978;p.37) එමෙන්ම එවැනි ප්‍රාදේශීය ඒකකවල විධායක නිලධාරීන් Perunkuri Mahasabhai, Perunkuripperumakkal සහ Älunkanam යන වචනවලින් හඳුන්වා ඇත.[67] (Ibid) මේ තොරතුරුවලින් පැහැදිළි වන්නේ ඔවුන් තුළ සමාජ භේදය මත ගොඩනැගුණු පන්ති භේදයක් පැවති බවයි.

මෙහිදී ඉන්දියාවේ මෙන්ම සංවිධිත පරිපාලන ක්‍රමවේදයක් මෙරට ගෙන ගියේදැයි විමසිය යුතුය. මෙරට පාලනය කළ චෝළ ප්‍රාදේශීය පාලකයින් පිළිබඳ සාක්ෂි නැතත් යුධ හමුදාවේ උසස් තනතුරුවලට හා සමාන්‍ය පාලන තන්ත්‍රයේ උසස් තනතුරුවලට චෝළයින් විසින් දකුණු ඉන්දියානුවන්ව පත්කරන්නට ඇති බව මහාචාර්ය සිරිවීරයන්ගේ අදහසයි.[68] (සිරිවීර,2001; පි.78) සාහිත්‍ය මූලාශ්‍රයන්හි සෘජුවම පාලක නාම සඳහන් නැතත් දිවයිනේ පාරිපාලනය සම්බන්ධ වැදගත් තොරතුරු සෙල්ලිපි මූලාශ්‍රවලින් හෙළිදරව් වේ. කයිට්ස් දූපතට එපිටින් ඇති හැම්මෙන්හිල් නම් කුඩා දූපතේ ලන්දේසි බලකොටුවක් තැනීමේදී හමු වූ කුඩා සෙල්ලිපිය මෙහිලා පෙන්වා දිය හැකි කදිම සාක්ෂියකි.[69] (Indrapala,1971;pp.10-12) මෙම ලිපියෙහි අධිකාරී සහ දණ්ඩනායක යන තනතුරු දෙකක් හඳුන්වා දී ඇති අතර මුළු සිංහල රාජ්‍යය පමණක් නොව රජු, ඔහුගේ දේවිය හා සියළු වස්තුව සමග ජයකොන්ත

මුවෙන්තාවෙළාර් නමැති යුධ හමුදාපති විසින් අල්ලා ගත් බව එහි සඳහන් වේ.[70] (Ibid) මෙහි සඳහන් මින්තෝල් පස්වැනි මිහිඳු යැයි සිතිය හැකි අතර රාජේන්‍ද්‍රචෝළ හමුදා ක්‍රි.ව.1017දී දිවයින ආක්‍රමණය කර රජු, දේවිය හා රාජාභරණ ලබා ගැනීමේ වංසකථා පුවත[71] (මහාවංසය, 2004; පි.249) මින් සනාථ වන බව පෙනී යයි. එමෙන්ම මෙම ජයග්‍රාහී යුධ ව්‍යාපාරය ගෙන ගිය සේනාපතිගේ නම සෙසු මූලාශ්‍ර තුළදී ගිලිහී ගියත් මෙහි එය සටහන් වීම ඉතාමත් වැදගත් වේ.

ඒ අනුව දිවයිනේ උතුරු ප්‍රදේශයේ බලය චෝළ අධිරාජයාට ලබා දුන් මෙම ජයන්කොන්ත මුවෙන්තාවෙළර් නම් යුධ හමුදාපති දිවයිනේ ඔවුනට හිමි ප්‍රදේශයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා යැයි අනුමාන කළ හැකිය. එසේම ඔහුට රට පාලනය කිරීමට භාර දී තිබූ බව මෙහි එන අධිකාරී හා දණ්ඩනායක යන වචනවලින් ද තහවුරු වෙයි. ඔහු ප්‍රතිරාජයකු ලෙස කටයුතු කළාද විය හැකිය. එනිසා උතුරු ලංකාව තුළ ඔවුනගේ පරිපාලනය චෝළ අධිරාජයා විසින් පත් කළ සෙන්පතියකු විසින් සිදු කර ඇති බව පැහැදිලිය.

චෝළ පාලන සමය තුළ මෙරට සිටි චෝළ කුමාරයකු පිළිබඳ වැදගත් තොරතුරු ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ හා මානාන්කෙනිවලින් සොයා ගත් ද්‍රවිඩ සෙල්ලිපි දෙකකින් අනාවරණය වී තිබේ.[72] (Gunasigam,1974;pp.3-17) එහි ඉලංකේස්වර තේවාර් (Ilankesvara tevar) නමින් හැඳින්වූ චෝළ කුමාරයකු පිළිබඳ සඳහන් කර තිබේ. ඉන් කන්තලේ ලිපියේදී ඔහු ශ්‍රී චෝළ සහ ශ්‍රී කංකවර්මර් යන නම්වලින්ද හඳුන්වා ඇත.[73](Ibid) මෙම සෙල්ලිපි දෙකෙහිම දින වකවානු යොදා ඇත්තේ ඔහුගේ පාලන කාලය තුළ නිසා ශ්‍රී චෝළ ඉලංකේස්වර තේවාර් නිසැකවම පාලකයකු වන්නට ඇත. ශ්‍රී කංකවර්මර් හා ඉලංකේස්වර තේවාර් වැනි නාම කිසියම් දේශපාලන වැදගත්කමක් ඇති නිලනාමයන් බව මහාචාර්ය පද්මනාදන් විසින්ද පෙන්වා දී ඇත.[74] (Pathmanathan. S.,1978;p.39) සිංහල පාලකයින් විසින් භාවිතා කළ ලංකේශ්වර යන්න චෝළ පාලකයින් විසින් ඉලංකේශ්වර ලෙස යොදාගෙන ඇති බව පැහැදිළි වේ. මෙසේ දේශීය නිල නාම පවා ආරූඪ කර ගනිමින් ශ්‍රී ලාංකේයයන්ට සමීප වීමට චෝළ පාලකයින් උත්සාහ කළද ඔවුන් මෙම විජාතීය පාලනයට අවනත නොවීය.

කන්තලේ පේරාරු ජනපදයේ ශිව දේවාල භූමියේ ඇති දෙමළ ශිලා ලිපිය ශ්‍රී චෝළ ඉලංකේශ්වර තේවාර් යන අන්වර්ථනාමයකින් හැඳින්වූ ශ්‍රී කංකවන්මාර් රජුගේ පාලන සමයේ දසවන අවුරුද්දෙහි පිහිටවූවකි.[75] (Gunasigam,1974;p.7) චෝළ පාලන සමයේ ශ්‍රී ලංකාව පාලනය කළ එකී නම ඇති රජකෙනෙකු පිළිබඳ දේශීය හෝ ඉන්දීය වෙනත් කිසිදු සාහිත්‍ය හෝ පුරාවිද්‍යාත්මක සාක්ෂියක් හමු වී නොමැත. එහෙත් සෙල් ලිපියේ එන කරුණු අනුව මොහු චෝළ අධිරාජ්‍යයාගේ ප්‍රතිරාජයකු ලෙස කටයුතු කළ බව දක්වෙන නිසා චෝළ පාලන සමය තුළ (ක්‍රි.ව.9921070) දිවයිනේ උතුරු ප්‍රදේශය පාලනය කළ අයෙකැයි සැලකිය යුතුය. එහෙත් අධිරාජයාගේ විවිධ ප්‍රදේශ භාරව කටයුතු කිරීමට ප්‍රතිරාජයන් පත්කිරීම ආරම්භ වූයේ පළමුවැනි රාජේන්‍ද්‍රචෝළ රජුගෙන් බැවින් ඔහු ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ ක්‍රි.ව.1017 න් පසු මොහු දිවයිනේ පාලනයට පැමිණියකු බව වටහා ගත හැකිය. මෙහි දක්වෙන ශ්‍රී චෝළ ඉලංකේශ්වර තේවාර්ගේ තත්ත්වය පාණ්ඩ්‍ය රාජ්‍යයේ ශ්‍රී චෝළ පාණ්ඩ්‍ය කුමාරවරුන්ගේ තත්ත්වයට සමාන විය.[76] (Pathmanathan.S.,1978;p.39) එනිසා චෝළ අධිරාජ්‍යය සතුව තිබූ අනෙකුත් මණ්ඩල මෙන්ම පාර සමුද්‍රිතව තිබූ ලංකාවත් කලක් චෝළ කුමාරයකු යටතේ පාලනය වී ඇතැයි සිතීමට මෙයින් ඉඩකඩ සැලසේ.

උතුරු ශ්‍රී ලංකාවේ චෝළ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී මෙම කන්තලේ ලිපියේ වටිනාකම ඉමහත්ය. ලිපියේ සඳහන් උක්ත සභා පිළිබඳ සැලකීමේදී ඉන්දියාව තුළ ඔවුනගේ විධිමත් පරිපාලන තන්ත්‍රය මෙන්ම මෙහිද කිසියම් සමිති සභා ක්‍රමයක් පැවති බව සනාථ වේ. සම්පූර්ණ ලෙස ආරක්ෂා වී නැති නිසා ලිපිය පූර්ණ වශයෙන් කියවා ගත නොහැකි වුවත් එහි පළමු කොටස අනුව රාජවික්කිරම වළනාඩු හෙවත් රාජේන්ද්‍ර චෝළ වළනාඩු ප්‍රදේශයෙහි රාජ සභාවට අයත් (පෙරුන්තුරි) බ්‍රාහ්මණ ගරු කටයුතු සාමාජිකයින් ශ්‍රී චෝළ ඉලංකේශ්වර තේවාර් රජුගේ පාලන සමයේ දසවන වර්ෂයේ කුම්භ(පෙබරවාරි) මාසයේ මුල් දෙසතිය තුළ දොළොස්වන තීර්ථයෙන් අඟහරුවාදා රාත්‍රී ප්‍රදේශයේ බදු එකතු කරන්නන් හා එක්ව කළ යමක් පිළිබඳව සඳහන් වේ.[77] (Gunasigam,1974;pp.21-22) මෙම දිනය ක්‍රි.ව.1033 පෙබරවාරි 13 හෝ ක්‍රි.ව. 1047 පෙබරවාරි 10 වැනි අඟහරුවාදා බව එල්.ඩී. ස්වාමි කන්නුපිල්ලෙයි පෙන්වා දී ඇත.[78] (Ibid,pp.11-12) එසේම මෙහි මහසභා හා මහජන සභා යනුවෙන් සභා දෙකක් පිළිබඳවත් දක්වයි.

එබැවින් පැහැදිළිවම එම පරිපාලන ප්‍රධානීන් හා ආර්ථික කටයුතු බෙහෙවින් විධිමත් ක්‍රමවේදයක් ඇතිව සිදු වූ බව පෙනී යයි. එහි බ්‍රාහ්මණ ගරු කටයුතු සාමාජිකයින් හා රාත්‍රී ප්‍රදේශයේ බදු එකතු කරන්නන් යනුවෙන් දැක්වීම තුළ මෙරට පාලනයේ චෝළ නිලධාරී මඬුල්ලක් සිටිබව අනාවරණය කරයි. මේ පිරිස් සොළී අධිරාජයාගේ ප්‍රතිපත්ති මෙරට ක්‍රියාගත කළ කාර්ය මණ්ඩලය බව නිසැකය. කන්තලේ ලිපියේ එන චතුර්වේදි මණ්ගලම් (චතුර්වේදීන් යනු බ්‍රාහ්මණයින්ය. [79] (මුදියන්සේ, 1997; 146)) හා පෙරුන්කුරිපෙරුමකල් (Perunkuripperumakkal) යන සඳහන් අනුව ඒ වන විට කන්තලේ බ්‍රාහ්මණ ජනපදයක් පැවති බවත් දකුණු ඉන්දියාවේ පරිදිම එහිද කටයුතු ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට කිසියම් සංගමයක් පැවති බවත් සනාථ වේ.[80] (Pathmanathan.S.,1978;p.37) චෝළ පාලන සමයේ සිටම පැවතෙන්නට ඇතැයි සිතිය හැකි තවත් මෙවැනිම බ්‍රාහ්මණ ජනපදයක් ගැන තොරතුරු මහාකිරින්දගමින් හමු වූ දෙමළ සෙල් ලිපියකින් අනාවරණය වී තිබේ.[81] (Ibid,p.38 - මුදියන්සේ, 1997; පි.148) එතුළින් ඔවුන්ගේ ප්‍රදේශ ව්‍යාප්තියද නැගෙනහිරින් අම්පාර දිස්ත්‍රික්කය දක්වා ව්‍යාප්තව පැවති බව හෙළිවේ. මින් පැහැදිළි වන්නේ නැගෙනහිර වෙරළ තීරය තුළත් අභ්‍යන්තරයේ වැදගත් වෙළෙඳ මධ්‍යස්ථාන ආශ්‍රිතවත් පැවති බ්‍රාහ්මණ ජනපදයන්හී විසූ දකුණු ඉන්දියාවෙන් කලින් කලට පැමිණි ඉහළ සිට පහළට සැදුම් ලත් නිලධාරී කණ්ඩායමක් විසින් මෙරට ආර්ථිකයත්, පාලනයත් මෙහෙය වූ බවයි. උතුරු ශ්‍රී ලංකාවේ සේවයෙහි යෙදී සිටි උසස් නිලධාරීන් 'උටයියාන්'(Utaiyan) නමැති පදවිය දරූ අතර ඔවුනගේ මුල් නිත්දගම් පැවතියේ චෝළ දේශයේය. [82] (Pathmanathan.S.,1978;pp.40-41) සෙසු නිළතලයන් වූ නාටාල්වාන් (Natalvan), කිලවාන් (Kilavan), පෙරාරයියාන් (Peraraiyan), පනිමකන් (Panimakan) හා සිරුතනම් (Cirutanam) වැනි තනතුරුද චෝළ රටින් පැමිණි හා මෙරට කලින්කලට විත් පදිංචිව සිටි ද්‍රවිඩ පිරිස් විසින් හොබවන්නට ඇත. දේශීය පිරිස් මෙම කිසිඳු පදවියකට පත් කර ගත් බවට සාක්ෂි නොලැබේ. චෝළ දේශයේදී මෙන්ම ඉඩම් මගින් මෙම නිලධාරීන්ගේ වේතන ලබා දී තිබූ බව; තත් කාලයට අදාල දිවයිනෙන් ලැබුණු චෝළ නිලධාරීන් විසින් හිංදු කෝවිල්වලට කරන ලද ඉඩම් ප්‍රදාන ඇතුළත් සෙල්ලිපි රැසකින් හඳුනාගත හැකිය. [83] (මුදියන්සේ, 1997; පි.147 Indrapala,1971;pp10-12.) ඔවුන්ගේ සියලු ක්‍රියාකාරකම් ආර්ථික වාසි

අරඹයා ගොඩනැඟී තිබූ නිසා දේශීයයන්ගේ සම්බන්ධයකින් තොරව මැනවින් ඒකාබද්ධ වූ ද්‍රවිඩ නිලධාරී පිරිසකගේ ආධාරයෙන් සකසාගෙන තිබූ බව පැහැදිලි වේ.

ඉන්දීය සාගර වෙළඳාම කේන්ද්‍රීය වූ චෝළ පරිපාලනයේ තවත් සුවිශේෂී අංශයක් ලෙස ඔවුන්ගේ ආරක්ෂක හට සේනාව හැඳින්විය හැකිය. සිංහල පාලකයින් වරින්වර ගෙන්වන ලද කුලී හමුදාවන් [84] (මහාවංසය, 2004; පිටු.158197208247249) හා චෝළ පාලකයින් ලංකාව ආක්‍රමණය කරන අවස්ථාවෙහිදී පැමිණි ද්‍රවිඩ සේනාවන්ද චෝළයින් හට මෙරට පරිපාලන කටයුතු සාර්ථක කර ගැනීමෙහිලාත් ආර්ථික කළමනාකරණය සඳහාත් සක්‍රිය දායකත්වයක් ලබා දුන් බව සිතිය හැකි වේ. මේ පිළිබඳව සාකච්ඡා කිරීමට බහුල තොරතුරු නැති වූවත් අගම්පඩි හා වේලයික්කාර සේනා මෙහිදී වැදගත් වූ බව පෙනේ.

මෙකී කරුණුවලට අමතරව මෙම හින්දු පූජ්‍යස්ථාන ආශ්‍රිතව ඇති ශිලාලේඛන සමුදාය තුළින් මෙහි ඇති පරිපාලනමය හා වාණිජ වටිනාකම මැනවින් විද්‍යමාන කරයි. උදාහරණ ලෙස දොළොස්වැනි සියවසේ අගභාගයටත් දහතුන්වැනි සියවසේ මුල්භාගයටත් අයත් යැයි සැළකෙන පදවිය ප්‍රදේශයෙන් සොයාගනු ලැබූ සෙල්ලිපි දෙකක් මෙහිදී පෙන්වා දිය හැකිය. මෙම ලිපි දෙක මගින් නානාදේශීස් නම් දකුණු ඉන්දිය වෙළෙඳ ප්‍රජාව වාසය කළ වීරපට්ටනම් සහ හින්දු ආගමික ආයතන අතර සිදු වූ අන්තර් ක්‍රියාවලිය පෙන්නුම් කරයි. [85] (Pathmanathan.S.,1984;pp.132-133) එම සෙල්ලිපි සාක්ෂි අනුව ශිව දේවාලයේ සේවා කටයුතු වෙනුවෙන් නානාදේසීන්වරුනට මෙම නගරය ප්‍රදානය කළේය යන ප්‍රකාශය මගින් වෙළඳ ප්‍රජාව හා ශිව දේවාල අතර පැවති දැඩි සම්බන්ධය කියා පායි.[86] (Ibid) ඒවා ශිව දේවාල හරහා හින්දු වෙළෙඳ ප්‍රජාවට හිමිව ඇති බව පෙනේ. එනිසා ශිව දේවාලවලට පූජාකරනු ලැබුවේ ආදායම් බහුල වෙළෙඳ නගරයි.

නගරම් යන්න මේ වන විට නානාදේශීන් විසින් ගොඩනගා පාලනය කළ නගර බව කියැවෙන හෙයින්[87] (Ibid) හින්දු දේවාලයකට පිදීම තුළින් එහි නෛතික අයිතිය ස්ථාවර කළේ යැයි අනුමාන කළ හැක. එපමණක් නොව නගරම් ශිව දෙවියන් උදෙසා කැපකළ නගරයක් ලෙස පැවතීම නිසා, පොළොන්නරු යුගයේ දිවයිනේ ප්‍රදේශ කිහිපයක ආගමික ස්ථානයන්වල ඒවාට කළ විවිධ ප්‍රදානයන්ට අමතරව එම නගරය විසින් එකී පූජනීය ස්ථානවල භාරකාරකත්වය සඳහා පුද්ගලයෙක් පත්කළ බවද මහාචාර්ය පද්මනාදන් පෙන්වා තිබීම මෙහිදී උක්ත මතය තවදුරටත් සනාථ කරන්නකි.[88] (Ibid) එසේනම් ශිවදේවාල භාරකරු හා වාණිජ නගරය නැතිනම් නානාදේශී ප්‍රජාව අතර පැහැදිලි බැඳීමක් පවතී. තව දුරටත් පැහැදිලි කරමින් මහාචාර්ය පද්මනාදන් පෙන්වා දෙන්නේ මේ වකවානුව වන විට නගරම් යන පාලන තන්ත්‍රය එහි ඇති ආගමික පූජ්‍යස්ථාන හා ඒ සම්බන්ධ අනෙකුත් ආයතනවල භාරකත්වය සහ වගකීම ඉසිළූ බව අනුමාන කළ හැකි බවයි.[89] (Ibid)

කාර්තිගේසු ඉන්ද්‍රපාල විසින් කන්තලේ නගරයට නුදුරුව පිහිටි ''සිවන්කෝවිල්'' නැමති ශිව දේවාලයේ නටබුන් අතරින් සොයාගෙන ඇති බිත්තියක එල්ලිය හැකි සේ සකස් කළ එකොළොස්වැනි සියවසට අයත් සෙල්ලිපියේ අන්තර්ගත කරුණු අඳුව එම කෝවිලේ ප්‍රධාන පූජකයා පළාතේ ආදායම් එකතු කරන්නා ලෙස දක්වා තිබීම මෙහිදී ඉතා වැදගත් සාක්ෂියක් වේ. [90] (Gunasingam,1974) මහාචාර්ය කේ. ඉන්ද්‍රපාල විසින් කරන ලද පරිවර්තනයට අනුව

චෝළ වළනාට්ටු පාලනය කරන්නා වූ ශ්‍රී සංකවන්මරාන් උඩයියාර් ශ්‍රී ශෝළ ඉළංකේශ්වරගේ දසවැනි රාජවර්ෂයෙහි කුම්භ මාසයෙහි කුජ දින රාත්තියෙහි රාජවිචාචාතිර වළනාට්ටුවෙහි රාජරාජ් චතුර්වීති මංගලත්තුවෙහි පෙරුම්කුරි මහසාවේ (සාමාජිකයින්) පෙරුමක්කල්වරුන් හා පළාතේ ආදායම් එකතු කරන්නා වූ මුත්තංකෙයි කෝවිලේ ප්‍රධාන පූජකයා වූ අවිවාහක තරුණයාද එක්ව වික්කිරමචෝළ ඇළ හා වෙනත් කුඩා ජලමාර්ග සංවර්ධනය කිරීම සඳහා පළාතේ ආදායම් වැය කිරීමට තීරණය කොට ඒ සඳහා බදු මුදල් ගෙවිය යුතු බව ප්‍රදේශවාසීන්ට නිවේදනය කිරීම මෙම ලිපිය පිහිටුවීමේ අරමුණ වී ඇත.[91](Ibid) එනිසා හින්දු පූජකයා හුදු ආගමික නියෝජිතයකු නොවන බවත් ඔහු ප්‍රදේශයේ ආදායම් බදු එකතු කිරීමේ නිලධාරියා ලෙස සේවය පුළුල් වී ඇති බවත් වෙනස් වූ බදු නීතිරීති සෙල් ලිපියකින් කෝවිලේ බිත්තියක ප්‍රදර්ශනය කිරීමට පියවර ගත් බවත් මින් පැහැදිලි වේ. එම නිසා චෝළ අවධියේ මෙරට පැවති සංකීර්ණ පරිපාලන රටාව ඒ වෙනුවෙන්ම සිටි නිලධාරීන්ට අමතරව ආරක්ෂක අංශය, පූජ්‍ය පක්ෂය හා කෝවිල් මෙන්ම වෙළෙඳ ප්‍රජාවගෙන් සැදුම් ලද ජාලයක් මෙන් ක්‍රියාත්මක වූ බව පෙන්වා දිය හැකි වේ. මේ අනුව ලැබෙන සීමිත සාක්ෂි සියුම්ව අ ීක්ෂා කර බැලීමේදී පෙනී යන්නේ ඉන්දියාව තුළ ඔවුන්ගේ මණ්ඩලවල පරිපාලන පටිපාටියට බොහෝ දුරට සාදෘශ්‍ය වූ, ආර්ථික කටයුතුවලට මූලිකත්වය ලබා දුන් පරිපාලන ක්‍රමවේදයක් උතුරු ශ්‍රී ලංකාව තුළදීත් ක්‍රියාත්මක කළ බවයි.

## අන්ත සටහන් (End Notes)

[1] මජුම්දාර් ආර්.ඒ, "ඉන්දියානු පසුබිම", ලංකා විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය, 1 කාණ්ඩය, 1 භාගය, කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 2000. පි.274.

[2] Neelakanta Sasthi K.A. The Colas, Vol.1, Madras. University of Madras, 1955, p.172.

[3] Ibid.

[4] ඉන්ද්‍රකීර්ති සිරිවීර, රජරට ශිෂ්ටාචාරය හා නිරිත දිග රාජධානි, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම, 2005, පි-76-

[5] බස්නායක එච්-ටී, යමුනා හේරත්, ඉන්දීය ශිෂ්ටාචාරය 2, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2004, පි-193-

[6] A.Veluppilalai, Ceylon Tamil Inscriptions, Part I, Peradeniya, 1971. pp.16 - 18- Ibid, Part II, Peradeniya, 1972. pp.42- 55.

[7] බස්නායක එච්-ටී, යමුනා හේරත්, එම, 2004. පි-197-

[8] Karthigesu, Indrapala, Epigraphia Tamilica, Part I,Vol.1, Jaffna Archaeological Society, Peradeniya.1971.pp.10-12.

[9] මහාවංසය, සංස්- හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, ඩී-එච්-එස්- අබේරත්න, දෙහිවල: බෞද්ධ සංස්-මධ්‍යස්ථානය, 2004. පරි.55:1 33ගාථා, පිටු.249250.

[10] බස්නායක එච්-ටී, යමුනා හේරත්, එම, පි.197.

[11] එම, පි- 196.

[12] රොලින්සන් එච්-ජී, භාරතීය සංස්කෘතික ඉතිහාසය, පරි-පරවාහැර පඤ්ඤානන්ද හිමි, රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුව, 1959- පි-182-

[13] බස්නායක එච්-ටී, යමුනා හේරත්, එම, පි- 198-

[14] හෝල් ඩබ්-ජී-ඊ, අග්නිදිග ආසියාවේ ඉතිහාසය, 1976. පි-68-